**අම්බලන්තොට ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය

සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී අනතුරට පත්වූ කැබ් රථයක් වෙනුවෙන් ලැබිය යුතු රු. 6,390,000 ක රක්ෂණ වන්දි මුදල ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ලැබිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ඉටුකළ කර්මාන්ත 02 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන රු.2,231,846 ක් අඩුවෙන් වෙන්කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ණයහිමි ප්‍රතිපාදන වෙන් කිරීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වතුර ටැංකි හා රාමු මිලදී ගැනීම වෙනුවෙන් ලැබිය යුතු රු. 1,320,000 ක් සඳහා ණයගැති ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ණයගැතියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ උසාවි දඩ ආදායම රු. 1,011,000 ක් හා මුද්දර ගාස්තු ආදායම රු. 467,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂය සඳහා උසාවි දඩ හා මුද්දර ගාස්තු අධි වෙන්කිරීම් රු. 504,312 ක් සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි . | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ලැබිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී ස්ථිර කාර්ය මණ්ඩල සඳහා ගෙවන ලද වැටුප් හා මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණයෙන් වැඩියෙන් ලද රු. 393,695 ක් ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ප්‍රතිපූර්ණය කරන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ රු. 142,900 ක යන්ත්‍ර හා උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | යන්ත්‍ර හා උපකරණ යටතේ ගිණුම් ගත කරන බව. | ස්ථාවර වත්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂයේ අවසාන තොගය රු. 129,883 ක් අඩුවෙන් දැක්වුණි | ඉදිරියේදී නිවැරදි කරන බව. | තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 02 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු. 258,507 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම හේතුවෙන් එකතුව රු. 3,158,134 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | හිඟ ශේෂයන් සඳහා සකස් කළ විස්තරාත්මක උප ලේඛනයක් සභාව සතුව නොමැති බව . | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | i. 126 වගන්තිය | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2021 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 11 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවාගෙන තිබුණි. | අවශ්‍යතාවය අනුව ඉදිරියේදී අනෙකුත් අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | ii. 134 (2) වගන්තිය. | දියුණු කළ ප්‍රදේශ කාලීනව හඳුනාගෙන වරිපනම් බල ප්‍රදේශය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් බල ප්‍රදේශයන් සංශෝධනය කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1946 අංක 30 දරණ බදු හා තක්සේරු කරන පනතේ 20 වන වගන්තිය | වරිපනම් දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අයකළ යුතු වුවත් එපරිදි කටයුතු නොකර 2011 වර්ෂයේ තක්සේරු වාර්තාව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකර තිබුණි. | වරිපනම් දේපළ තක්සේරු කිරීම සඳහා තක්සේරු නිලධාරීන් සභාවට නොපැමිණි නිසා පැරණි තක්සේරුව අනුව වරිපනම් බදු අය කළ බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ජේදය | සභාව සතු ධාවන තත්ත්වයේ ඇති වාහන 25 ක ඉන්ධන දහන පරික්ෂාව විගණිත දින වන විටත් සිදුකර නොතිබුණු අතර වාහන 13 ක ඉන්ධන දහන පරික්ෂාව සිදු නොකල කාල පරාසය වසර 01 ත් 05 ත් අතර වූ අතර ඉතිරි වාහන 12 අදාළ විස්තරයන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී මෙම වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 7,363,800 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 2,412,189 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,581,000 | 5,377,655 | 6,696,803 | 3,857,460 | 4,962,100 | 4,919,474 | 4,187,533 | 5,176,608 |
| කුලී | 254,271,000 | 12,493,686 | 14,023,430 | 8,748,833 | 18,037,500 | 18,436,335 | 11,320,957 | 10,278,577 |
| බලපත්‍ර ගාස්තු | 2,778,000 | 2,023,292 | 2,448,562 | 760,245 | 2,750,200 | 1,970,965 | 1,370,510 | 1,185,515 |
| වෙනත් ආදායම් | 18,543,000 | 8,486,845 | 8,552,093 | 549,911 | 31,503,290 | 7,199,280 | 6,616,896 | 615,159 |
| **එකතුව** | 281,173,000 | 28,381,478 | 31,720,888 | 13,916,449 | 57,253,090 | 32,526,054 | 23,495,896 | 17,255,859 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් බදු රු. 3,574,690 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර 131 කින් ලැබිය යුතු කඩ කාමර කුලී හා දඩ රු. 1,234,810 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු.102,435 ක් අය කර ගෙන රු. 64,965 ක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත කපා හැර ඇති අතර ඉතිරි මුදල් අය කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | හුංගම පොදු වෙළඳපොල කඩකාමර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර සභාව වෙත 2019 අප්‍රේල් 01 දිනැති අංක HT/RP/936 දරණ ලිපිය පරිදි නව තක්සේරු කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් 2022 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 12 කින් ලැබිය යුතු මුළු හිඟ කඩකාමර කුලිය රු. 1,035,000 ක් විය. | කඩකාමර 12 න් 6 ක් නඩත්තු කටයුතු සඳහා කඩා ඉවත් කර තාවකාලික කඩකාමර ඉදිකළ අතර ඒ සඳහා තක්සේරුවක් ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවට ලිපි යොමු කළ අතර ඉතිරි කඩකාමර වලින් ලැබිය යුතු රු.507,000 ක් දේපල තහනම් කිරීම හෝ කඩකාමර පවරා ගැනීම මඟින් අය කරන බව. | තක්සේරු කුලිය අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාර්ෂිකව බදුදෙන දේපළ 10 කින් ලැබිය යුතු රු. 4,310,998 ක් හා පෙර වර්ෂ 03 ට අදාළ ටෙන්ඩර් බදු නඩු පැවරීම් වෙනුවෙන් ලැබිය යුතු රු. 1,427,941 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත රු. 2,113,708 ක් කපා හරින ලද බවත්, ඉකුත් වර්ෂයන්ට අදාළව ලැබිය යුතු රු.1,427,941 ක ශේෂයට අදාළ තොරතුරු සොයා ගත නොහැකි බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු වාහන හා උපකරණ කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 1,775,084 ක් හිඟව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 78 කින් ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු. 72,750 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගාස්තු නොගෙවූ ව්‍යාපාර 49 සඳහා නඩු පැවරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 62 කින් ලැබිය යුතු රු. 687,495 ක දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සේවා සඳහා ගාස්තු රු. 180,095 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (එ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,874,045 ක් හා රු. 19,016,320 ක් විය. | ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිවිසුම ප්‍රකාරව අතුරු බදු දීම සිදුකළ නොහැකි වුවත්, අම්බලන්තොට වෙළඳපොළ කඩ කාමර 09 ක් අතුරු බදු දීම සම්බන්ධව අවශ්‍ය කටයුතු සහා කළමණාකාරීත්වය ගෙන නොතිබුණි. | අතුරු බදු දී ඇති බව සනාථ වුවහොත් බදු ගිවිසුම අහෝසි කර නැවත දේපළ ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බව. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | හුංගම ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ ආදායම් පරීක්ෂක විසින් සමාලෝචිත වර්ෂයේදී රැස්කළ එකතුව රු. 311,470 ක ආදායම් සහ සභාවේ ආදායම් පරීක්ෂකවරු තිදෙනා විසින් 2022 වර්ෂයේ මාස 03 කදී රැස්කර තිබූ රු. 177,614 ක් දින 04 ත් දින 51 ත් අතර කාලයක් අත රඳවා ගෙන තිබුණි. | ක්ෂේත්‍රයෙන් එකතු කර ගන්නා මුදල් එදිනම හෝ ඊට පසුව එන වැඩ කරන දිනයේදී සභාවට ගෙවන මෙන් නිලධාරීන් දැනුවත් කළ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන හා යන්ත්‍ර 02 ක් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම වාහන අක්‍රීය පවතින කාලය පිළිබඳ තොරතුරු නොතිබුණි. තවද 2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව වෙන්දේසි කිරීමට නියමිතව තිබූ වාහන හා යන්ත්‍ර 03 ක් වෙන්දේසි කිර නොතිබුණි. | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ තීරණ අනුව වෙන්දේසි කිරීමට නිර්දේශිත ට්‍රැක්ටර් රථ 02 හා කැබ් රථය වෙන්දේසි කිරීමට සහ ඉතිරි වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ව්‍යාපෘති, කර්තව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ අයවැය ලේඛනයේ ඇතුළත්ව තිබූ එකතු වටිනාකම රු. 422,113,000 ක් වූ සංවර්ධන යෝජනා 22 ක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට සහා කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි. | අපේක්ෂිත ආදායම් නොලැබීම නිසා මෙම සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීමට නොහැකි වූ බව. | අයවැයගත සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 වගන්තිය අනුව ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩ හෝ වැඩ සඳහා වන පිරිවිතර අදාළ ප්‍රසම්පාදන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට විස්තර කළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර එකතු වටිනාකම රු.290,275 ක් වූ භාණ්ඩ වර්ග 04 ක් මිලදීගෙන තිබූ අතර 2.8.4 වගන්තිය අනුව එකතු වටිනාකම රු. 344,875 ක් වූ මිලදී ගැනීම් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර වාර්තාවක් ලබා ගෙන නොතිබුණි. | ඉදිරි මිලදී ගැනීම් වලදී නියමිත පිරිවිතර සඳහන් කරමින් හා අවශ්‍ය තාක්ෂණික කමිටු නිර්දේශ ලබාගෙන මිලදී ගැනීමට කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොම්පෝස්ට් අංගනයේ වහලය සහ ගොනු අංගනය ඉදිකිරීමේ කර්මාන්තය නියමිත දිනට නිම නොකිරීම මත අයකළ යුතු රු. 109,437 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | ප්‍රමාද ගාස්තුව රැඳවුම් මුදල් ගෙවීමේදී අඩු කර ගෙවීමට කටයුතු කරන බව. | ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලියන්ගස්තොට ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා රු.3,399,762 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණද එම මුදල තුල වොට් 100 ප්‍රමාණයේ ප්ලෑෂ් ලයිට් 04 ක් සපයා සවිකිරීමේ සහ ඒ සඳහා විදුලිය ලබාදීමේ කාර්යය ඉටුනොකර තිබියදී රු.126,981 ක් ගෙවීම් කර තිබුණි. | ව්‍යාපෘතියට අදාළ රැඳවුම් මුදල් ගෙවීමේදී අඩුකර ගැනීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවා ඇති මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. |
| (ඇ) | ලෝලුපතාන ගල්කැටි මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා 1,889,670 ක නිම්වැඩ වාර්තාවක් සකස් කර ගෙවීම සඳහා සභාව වෙත ඉදිරිපත් කර තිබූ අතර මාර්ගයේ වර්ග මීටර් 409 ක ප්‍රමාණයක ගල්කුඩු යෙදීම හා ප්‍රවාහනය වෙනුවෙන් රු. 111,378 ක් ගෙවීම් වාර්තාවට ඇතුලත් කර තිබුණද වර්ග මීටර් 135 ක ප්‍රමාණයක ගල්කුඩු යොදා නොතිබුණි. | මාර්ගයේ නැවත ගල් කුඩු අතුරා සකස් කරන ලෙස කොන්ත්‍රාත්කරු දැනුවත් කළ අතර ඉටු නොකළහොත් රැඳවුම් මුදලින් අඩුකර ගෙවීම් කිරීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවීමට ඇතුළත් කළ මුදල් නැවත අයකරගත යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ සේවය කරන නිලධාරීන් 09 දෙනෙකු අනුමත රාජකාරි වලින් බැහැරව වෙනත් රාජකාරිවල යොදවා තිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | සේවකයින් අනුමත රාජකාරියේ යෙදවිය යුතුය. |
| (ආ) | සේවය හැරගිය, විශ්‍රාම ගිය සහ සේවයෙන් පහකළ නිලධාරීන් 10 දෙනෙකුගෙන් උත්සව අත්තිකාරම්, විශේෂ අත්තිකාරම් සහ ආපදා ණය ලෙස ලැබිය යුතු රු.281,293 ක් අයකර ගෙන නොතිබුණු අතර එම හිඟ ණය අයකර ගැනීම සඳහා අයකර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සභා කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි | රු.10,050ක් අය කර ගත් අතර ඉතිරි ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කර ගත යුතුය. |